

කෘෂිකර්ම හා ඉඩම් ඇමැතිවර ගරු හෙක්ටර් කොබ්බෑකඩුව මහතා පොල් තෙල් පහනක් දල්වා නව බීජ පරීක්ෂණාගාරය විවෘත කරයි. උප ඇමැති එච්. ඇම්. නවරත්න මහතා පසෙකින් සිටී.

# බීජ නිෂ්පාදනයට ආ. කෘ. ස. සහාය

කෘෂිකර්ම හා ඉඩම් ඇමති ගරු හෙක්ටර් කොබ්බෑකඩුව මහතා විසින්, පසුගිය ඔක්තෝබර් 16 වැනි දින ගන්නොරුවෙහි අලුතින් පිහිටුවන ලද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යම බීජ පරීක්ෂණාගාරය විවෘත කරන ලද්දේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට විසිපස් වසරක් පිරීම නිමිත්තෙනි. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාර ඇතිව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් අරඹනු ලබන බීජ වැඩි දියුණු කිරීමේ හා නිෂ්පාදනය කිරීමේ පස් අවුරුදු වැඩ සටහනක ආරම්භක පියවර මෙය වේ.




ගන්නොරුවේ මධ්‍යම බීජ පරීක්ෂණාගාරය විවෘත කිරීමේ උලෙලේදී ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සුබාෂ් මජුම්ඩාර් මහතා කතාකරයි. දකුණෙන් සිටින්නේ කෘෂිකර්ම අධ්‍යක්ෂකවර පී. ටී. ජිනේන්ද්‍රදාස මහතාය. වමෙන් සිටින්නේ කෘෂිකර්ම හා ඉඩම් ඇමැති ගරු හෙක්ටර් කොබ්බෑකඩුව මහතා

වැඩි දියුණු කළ බීජ නිපදවීමේ හා බෙදහැරීමේ වැඩ සටහන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අරඹන ලද්දේ දැනට දොළොස් වසරකට පෙරය. මෙම වැඩ සටහන මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැඩියක්ම නිපදවා ඇත්තේ බිත්තර වී වන අතර වෙනත් ක්ෂෙත්‍ර බෝගවල හා එළවලු වර්ගවල ඇට ද සෑහෙන ප්‍රමාණයක් නිපදවා ඇත. එහෙත් මෙසේ බෙදහරින ලද වැඩි දියුණු කළ බීජ ප්‍රමාණය දිවයිනේ ගොවි මහතුන්ගේ අවශ්‍යතා සපුරා ලීමට කිසිසේත් ප්‍රමාණවත් නොවීය. ගොවි මහතුන්ගෙන් දිනපතා ලැබෙන දහසකුත් එකක් වූ ඉල්ලීම් සපුරාලීම සඳහා ලහි ලහියේ නිපදවා කඩි මුඩියේ බෙදහරින ලද මෙම බීජ බොහෝ විට අවශ්‍ය ප්‍රශස්ත තත්ත්වයට සියයට සියයක්ම එළඹී නොතිබිනි. තවද, කරල් ඉරිඟු, බඩඉරිඟු, කුරක්කන්, කව්පි, සුදු පරිප්පු, රටකජු, තල හා සෝයා බෝංචි අවශ්‍ය තරම් නිපදවා බෙද හැරීමේ පහසුකම් ද විරල විය. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ද සහාය ඇතිව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් බීජ නිෂ්පාදනය කිරීමේ හා බෙද හැරීමේ පස් අවුරුදු වැඩසටහනක් පිළියෙල කරන ලද්දේ එබැවිනි.

ක්ෂුද්‍ර නිවාරණ ව්‍යාපාරයේ හා ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අනුග්‍රහයෙන් ඕස්ට්‍රේලියානු මෙතෝදිස්ත සභාව මගින් පිරිනමන ලද ඩොලර් 554,838 ක ආධාරයක් මෙහි ලා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලැබේ. ඩොලර් 961,078 ක අගයට සරිලන මුදලක් ලක් රජය මගින් මෙම ව්‍යාපාරය වෙනුවෙන් වැය කරනු ඇත.

දිවයිනට අවශ්‍ය තරම් වැඩිදියුණු කළ බීජ නිපදවා බෙද හැරිය හැක්කේ පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය මගින් ඒකාබද්ධ ලෙස අරඹනු ලබන වැඩ සටහනක් මගින් පමණකි. යෝජිත නව ව්‍යාපාරය අරඹන ලද්දේ ඉහතකී අදහස පෙරදැරි කරගෙනය. අපට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය අප විසින්ම නිපදවා ගැනීමට නම් වැඩි දියුණු කළ ආරවල බෝග වර්ග වැඩි වැඩියෙන් වගා කිරීමට අපට සිදුවේ. වැඩි අස්වැන්නක් ලබාගැනීමට හේතුවන එක් සාධකයකි උසස් ආරවල බීජ බිත්තරට යොදා ගැනීම. බිත්තරට ගැනීමේ කාර්‍යයන් සඳහා අවශ්‍ය බීජවර්ග සියයට සියයක්ම අප රටේ නිපදවා ගැනීමට මෙම වැඩ සටහන නිසා හැකිවනු ඇත.

බීජ නිපදවා බෙදහැරීම පිළිබඳව දැනට දෙපාර්තමේන්තුව දරණ වගකීම කල් යාමේදී බීජ ගොවීන්ට පවරා එම බීජ උසස් තත්ත්වයෙන් යුතු බීජ බව සහතික කිරීම පමණක් දෙපාර්තමේන්තුව මගින් තවදුරටත් තබාගනු ඇත.

ඇස්තමේන්තු කර ඇති නිෂ්පාදන ඉලක්ක පස්වසරක් තුළදී සපුරා ලීමට වැඩ සටහන මගින් බලාපොරොත්තු වේ.



ගන්නොරුවේ පිහිටි නව බීජ පරීක්ෂණාගාරය



බීජ පරීක්ෂණාගාරයේ කාර්ය භාර නිලධාරි පී. අත්තනගොඩ මහතා එහි කෙරෙන කටයුතු ගරු ඇමතිතුමාට විස්තර කර දෙයි.